

"මම රජෙක් නොව, ජනතාවගේ ප්‍රධාන සේවකයා වන්නෙමි."

(2015-01-09 වන දින නිදහස් චතුරශ්‍රයේදී ජනාධිපති ධූරයේ දිවුරුම් දෙමින්)



"රටේ සියලු ජන කොටස් අතර සාමය සහ සංහිඳියාව ගොඩනඟා සියලුදෙනාට සමඟියෙන් සහ විශ්වාසයෙන් ජීවත්විය හැකි රටක් ගොඩනගමි."

(2015-01-11 වන දින ශ්‍රී දළදා මාළිගා පරිශ්‍රයේදී ජනතාව අමතමින්)

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# මව්බිමේ අභිසෙස් වසරක්

## දින තුන්සිය හැටපහක නොනිම් අරගලය



- පටුන -


අඥුරට එරෙහි අරගලය 7

විධායකය ප්‍රජාතන්ත්‍රවාදී කිරීම 11

නිදහසට අරුමැසි කොමිෂන් 13

සංහිඳියා ආණ්ඩුකරණයක උදාව 15

සුවසෙතට විවර කළ මග 19

දුම්වැටියෙන් දැවුණු දැය මුදවාලීම 21

වස විස සුන් කෙතකට මාවත 23

භාෂණයේ නිදහසට එළඹුමක් 25

හරිත දැයකට මං පෙත 27

වල්වැදුණු නීතියට විරාමය 29

කාම සුබල්ලියට එරෙහිව 31



"මම රජෙක් නොව, ජනතාවගේ ප්‍රධාන සේවකයා වෙමි."

(2015-01-09 වන දින නිදහස් චතුරශ්‍රයේදී ජනාධිපති ධුරයේ දිවුරුම් දෙමින්)

# අඳුරට එරෙහි අරගලය

2014 නොවැම්බර් 21 වන දින මුළු රටම දෑස් දල්වා බලා සිටි දිනයකි. ඒ සතර දෙස තවු සැලුණු සුභ ආරංචිය යථාර්ථයක් වෙතැයි සිතමිනි. නොවැම්බර් 21 දින මධ්‍යාහ්නය ආරංචිය යථාර්ථයක් කරමින් මෛත්‍රීපාල සිරිසේන නම් රජරට ගැමි නායකයාණන් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව තුළ දැරූ සෞඛ්‍ය අමාත්‍යධුරයෙන් ඉවත් වී එළැඹෙන ජනාධිපතිවරණයේදී පොදු අපේක්ෂකයා වන බව ප්‍රකාශ කළේ රටම අමන්දානන්දයට පත් කරමිනි.

එය නිර්භීත පියවරකි. බලවත් විධායක ජනාධිපතිවරයෙකුට එරෙහි විය හැක්කේ තමා ගැන, තම පවුල ගැන ජීවිත අවධානම ගෙන ය. 2010 වසරේ පැවැත්වූ ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ යුද වීරයා වූ සරත් ෆොන්සේකා මහතාට අත්වූ ඉරණම ගැන කල්පනා කළ කිසිවෙකු ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමේදී දෙවරක් නොව සියවරක් සිතන යුගයක ජාතික අභිලාෂය උදෙසා තම ආත්මහරණය කොට තීන්දුවකට එළැඹීම නිර්භීත තීන්දුවකි.

රට වෙනුවෙන් නිසි මොහොතේ නිසි තීන්දුවකට එළැඹීමට මෛත්‍රීපාල සිරිසේන මහතාට සිදු වූයේ ඓතිහාසික වගකීමකට උරදීම වෙනුවෙනි. එකී තීන්දුව ඓතිහාසික හා තාර්කික උවමනාවක් සැපිරීමක් මිස අහඹුවක් නොවේ. රට අභ්‍යන්තරිකවත් ජාත්‍යන්තරිකවත් ඉතා නරක දිශානතියකට ගමන් කර තිබූ හෙයින් සමාජ, දේශපාලනික, ආර්ථික, සංස්කෘතික වෙනසක් රට අපේක්ෂා කළේය. එකී පරිසරය වටහා ගැනීමෙන් මේ සමාජ හා ජාතික උවමනාව කෙතරම් ගැඹුරු වී ද යන්න පැහැදිලි වේ.

2015 ජනාධිපතිවරණය මෙන්ම 2005 ජනාධිපතිවරණය ද ඓතිහාසික වූ මැතිවරණයකි. 2005 වනවිට දශක තුනක් පුරා පැවතුන කොටි ත්‍රස්තවාදය විසින් රට බරපතල ඉරණමකට කැඳවමින් තිබූ අවධියකි. රට එක් පෙරමුණකට පෙළ ගැසී මහින්ද රාජපක්ෂ මැතිතුමාව 2005 දී ජනාධිපතිවරයා ලෙස පත්කර ගත්තේ කොටි ත්‍රස්ත වියරුවෙන් රට ගලවා ගනිතැයි විශ්වාසයෙනි.

එතුමා විසින් කොටි ත්‍රස්ත වියරුවෙන් රට ගලවා ගැනීමේ ජනතා කෘතවේදීත්වය මත 2010 දී යළිත් ජනාධිපතිවරයා ලෙස අති විශිෂ්ඨ ලෙස තෝරා පත් කර ගත්හ. ඒ ජනරළ වේගය මත දැවැන්ත විප්ලවීය වෙනසක අභිලාෂය රැඳුණි. ඒත් රටේ ජන අභිලාෂය වෙනුවට එක් පවුලක බල පරාක්‍රමයකට රට යටවුණි. ඉර පායන්නේ මල් පිපෙන්නේ සඳ පුදින්නේ තමන් නිසා යැයි ඔවුහු කල්පනාවේ නිමග්න විය. රටේ ජන මනසේ ද එසේ විය යුතු යැයි මතවාදය විය.

1948 නිදහස දිනා ගැනීමෙන් පසු බලයට පත් ආණ්ඩු අඩු වැඩි වශයෙන් නොබැඳි ප්‍රතිපත්තිය මත ජාත්‍යන්තරය සමග ගනුදෙනු කරනු ලැබීය. කොටි ත්‍රස්ත උමතුව වැනසීම උදෙසා

ඉන්දියාව ඇමරිකාව ප්‍රමුඛ බොහෝ රටවල් සහයෝගය පළ කළේ ඒ මිත්‍රශීලීත්වයට ගරු කිරීමක් ලෙසිනි. 2010-2015 කාලය තුළ අපේ රට ජාත්‍යන්තරය සමග ගනුදෙනු කළේ දඩබ්බර ලෙසිනි. ශ්‍රී ලංකාව පවතින්නේ ලෝකය තුළ නොව ලෝකය පවතින්නේ ශ්‍රී ලංකාව තුළය යන්න මූලික සිතුවිල්ල විය. ලංකාවට පැමිණි විදේශීය රාජ්‍ය නායකයින් රාජ්‍ය තාන්ත්‍රිකයින් උපහාසයට මෙන්ම හිංසනයට ද බඳුන් කළේය. ජාතික ධනය ජාතික සම්පත් වරදාන ලෙස විදෙස් රටවල්වලට දීමෙන් ජාත්‍යන්තර සම්බන්ධතා තහවුරු කළ හැකි ලෙස කල්පනා කළේය. මැරයන් සල්ලාලයන් විදේශ සේවයට අනුයුක්ත කර ඔවුන්ගේ මැර බලයෙන් හා සල්ලාල ක්‍රියාමාර්ග ඔස්සේ ජාත්‍යන්තර සම්බන්ධතා පාලනය කිරීමේ උපාය මාර්ගයක් ද විය. තවත් වරෙක විදේශ රටක් සමග එකතුව තවත් රටකට එරෙහිව ඔත්තු සපයමින් අවි ආයුද දෙමින් ත්‍රස්ත කල්ලි සමග ගනුදෙනු කරමින් ජාත්‍යන්තර සබඳතා තහවුරු තර ගත හැකි යැයිද කල්පනා කළේය. මෙකී මුග්ධ උපාය මාර්ගයන් විසින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර තලය තුළ ඉතා නරක දිශානතියකට ගමන් කළේය. යුද අපරාධ චෝදනා නිල නොවන ලෙස එල්ල විණි. ආර්ථික තහංචිවලට ගොදුරු වීමට නියමිත වුණි. 2012 සිට ඇමරිකාව ප්‍රමුඛ බටහිර රටවල් සාජුවම ශ්‍රී ලංකාවට එරෙහි විවිධ චෝදනා ඉදිරිපත් කළහ.

ශ්‍රී ලාංකික රාජ්‍ය තාන්ත්‍රිකයින් රාජ්‍ය නායකයින් විදේශ ගතවූ විට ඔවුන්ට එරෙහිව එකී රටවල් තුළ උද්ඝෝෂණ හා සත්‍යක්‍රියා පවත්වනු ලැබීය. ජාත්‍යන්තර තලය තුළ ශ්‍රී ලංකාව හුදෙකලා වෙමින් තිබුණි. ශ්‍රී ලංකාව වෙනුවෙන් ජාත්‍යන්තරය තුළ පෙනී සිටියේ රටවල් කිහිපයකි. ශ්‍රී ලංකාවේ අසල්වැසි ඥාතියා වන ඉන්දියාව ද ඒ අතර නොවී ය.

ජාත්‍යන්තරය සමග ගනුදෙනු කිරීමේ උපාය මාර්ගයේ මුග්ධකම මින් ප්‍රකට විය. මෙය පාලකයින්ට පමණක් නොව ශ්‍රී ලංකා රාජ්‍යය ද ඉතා බරපතල අනතුරකට හෙළන්නක් විය. මෙය තේරුම් ගෙන නිවැරදි වීමට මහින්ද රාජපක්ෂ පාලනයට අවශ්‍ය නොවීය. නොඑසේනම් වීමට නියමිත ව්‍යසනය සම්බන්ධ දැක්මක් නොවීය.

තවත් දිසාවකින් රට අභ්‍යන්තරයේ වියවුල් ගණනාවකට ගොදුරු වෙමින් තිබිණි. රට තුළ මාධ්‍ය නිදහස ද හකුලණු ලැබීය. අවම ප්‍රජාතන්ත්‍රීය අවකාශයන්ටවත් ඉඩක් නොවීය. ප්‍රජාතන්ත්‍රීය ආයතන ව්‍යුහයන් බිඳ දැමිණි, නොඑසේනම් අක්‍රීය කරනු ලැබිණි. ඒවා කෙරෙහි ජන විශ්වාසය බිඳ දැමිණි, අල්ලස දූෂණය ජනගත කළේ සාමාන්‍යකරණය කිරීමෙනි. අධිකරණයේ ස්වාධීනත්වය වනසන ලදී. හිතුමනාපෙට අගවිනිසුරුවරිය පළවා හැර තමන්ට අවනත අයකු පත් කෙරිණි. තමන්ට රුචි පරිදි තමන් විසින්ම ලියා නඩු තීන්දු ප්‍රකාශයට පත් කෙරිණි. කොටි ත්‍රස්ත වියරුවෙන් රට ගලවාගත් වහාම ජාතික සංහිඳියා ප්‍රතිපත්තියකට රට යටත් කළ යුතුව තිබිණි. ඒ වෙනුවට තිබූ ජාතික ආගමික සංහිඳියාව පවා කුරිරු ලෙස බිඳ දමනු ලද්දේය. යකඩින්, ගලෙන්, වැලියෙන්, සිමෙන්තියෙන් ජාතික ආගමික ඒකාබද්ධතාවය ශක්තිමත් කළ හැකි යැයි කියවීම විය.

විවිධ ජන කොටස් විවිධ ආගමික කල්ලි එකිනෙකාට එරෙහිව පොළඹ වන ලදී ඔවුනොවුන්ගේ ගැටලු විසඳනවා වෙනුවට ඒවා

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

තීව්‍ර කරමින් තම යැපීම වෙනුවෙන් එම ප්‍රශ්න කළමනාකරණය කරන ලදී. ආන්තික ආගමික කල්ලි ඔවුනොවුන්ගේ ගැටලු මහපාර මැද බාහු බලයෙන් විසඳා ගැනීමට ඉඩ හැර බලා සිටියේය. විටෙක ඒවාට දිරි දුනි. එකිනෙකා සමග කාකොටා ගන්නා කාලකන්නි අඳුරු දිශාවකට රට ගමන් කරන මගකට විවර වෙමින් තිබිණි.

තවත් දිසාවකින් අධික පොළී මත චීනයෙන් කඩාවැටුණු ණය මත සෝබන සංවර්ධනයකට රට කැඳවන ලදී. ජනයා නැති ශුෂ්ක කලාපවල අධිවේගී මාර්ග ඉදිකෙරිණි. ජන ශූන්‍ය කලාපවල සම්මන්ත්‍රණ ශාලා ඉදිකරන ලදී. කලාකරුවන්ට ළංවීමට නොහැකි රංග ශාලා ගොඩනැංවිණි.

වරායවල්, ගුවන්තොටුපළවල්, පාවෙන අවන්හල් වැනි ජාතික නිෂ්පාදනයට හවුල් නොවන මෙගා ව්‍යාපෘති ගොඩනංවන ලද්දේ මේ මෙගා ව්‍යාපෘති හරහා තම සහචර අනුචර කවයකට ප්‍රකෝටි ගණනින් ජාතික ධනය කොල්ලකෑමට ඉඩ විවර කර දීමටය. මේ චෞර කවයට එරෙහිවන්නන්ට සිදුවූයේ ජීවිතයෙන් වන්දි ගෙවීමටය. නිල ලත් පොලිසිය හා හමුදාව මෙන්ම නිල නොලත් සන්නාහ සන්නද්ධ මැර කල්ලියක්ද ක්‍රියාත්මක කළේය. ජනයා අතර එය සුදු වෑන් සංස්කෘතිය ලෙස ප්‍රකට විණි. මරණ බිය සතර දෙස රජයන ධවල භීම යුගයක් නිර්මාණය වී තිබිණි. මෙවන් විපරීත සමාජ, දේශපාලන, ආර්ථික වටපිටාවක් සහිත රටක් වූ ශ්‍රී ලංකාව ගැන ජාත්‍යන්තර ජන මතයේ සටහන් වූයේ පිලිපීනයේ මාර්ෂල් ලෝ යටතේ පාලනය කළ මාකෝස් පන්නයේ ආණ්ඩුවකි. ඩුවෙලියේලා යටතේ වූ හයිටිය පාලනය කළ ආණ්ඩුවක් වැනි රටකි. ඉන්දුනිසියාව පාලනය කළ සුහර්තෝ පන්නයේ ආණ්ඩුවකි. බෙන් අලි යටතේ පාලනය කළ ටියුනීසියාව වැනි ආණ්ඩුවකි. ගඩාෆි යටතේ පාලනය වූ ලිබියාව පන්නයේ ආණ්ඩුවකි. සදාම් හුසේන් යටතේ පාලනය වූ ඉරාකය වැනි ආණ්ඩුවකි. මෙවැනි රටක ඉරණම සම්බන්ධයෙන් ජාත්‍යන්තරයේ ප්‍රතිපත්තීන් මෑදු නොවන බව රටේ බහුතරයකට අවබෝධ වෙමින් තිබිණි. මේ මහා ජාතික වියවුලෙන් ගැලවීමට මගක් ජාතියට අවශ්‍ය වෙමින් තිබුණි. ජාතික ව්‍යසනකට රට ගොදුරු වූ කල්හි ඉන් රට ගලවා ගැනීමේ වීර පුරුෂයන් නිර්මාණය කරන පිළිබිඹකි ශ්‍රී ලංකාව. එකී අතීත මග වෙතින් වීර පුරුෂයකු නොවැම්බර ජාතිය හමුවේ පෙනී සිටියහ. ප්‍රතිපත්ති මූලිකව රට නව දිශානතියකට යොමුකරන බව ප්‍රථම ප්‍රතිපත්ති සමුදායේ මූලික රාමුව විය.

උතුර, දකුණ, බටහිර, නැගෙනහිර සිවුදෙස ජනයා එක පෙළට රොක්ව 2015 ජනවාරි 8 දා මෛත්‍රීපාල සිරිසේන නම් ගැමි ගොවි නායකයාණන්ව 06 වැනි විධායක ජනාධිපතිවරයා ලෙස පත්කර ගනු ලැබූහ. මේ අරුමැසි වෙනසේ විප්ලවයට මාවත විවර කළ වීරයා 2014 නොවැම්බර් 21 වන දින රට හමුවේ සපථ වූ ප්‍රතිපත්ති මූලික රටකට පදනම මේ වනවිට දමා ඇත. එදින රට හමුවේ තැබූ මූලික ප්‍රතිපත්තීන් මේ වනවිට ජයග්‍රහණය කර ඇත්තේ මෙලෙසිනි.



# විධායකය ප්‍රජාතන්ත්‍රවාදී කිරීම

1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් තහවුරු කළ විධායක ජනාධිපති ක්‍රමයට එරෙහි ව 1977 ඔක්තොම්බර් 04 වැනිදා හිටපු අග්‍රාමාත්‍යවරියක වූ සිරිමාවෝ ආර්.ඩී. බණ්ඩාරනායක මැතිණිය එරෙහි වූවාය. ඒ ප්‍රජාතන්ත්‍රවාදී මානව අයිතීන් අහෝසි වී තනි පුද්ගල ආඥාදායකත්වයක් නිර්මාණය වී රට ඒකාධිපතියකුගේ බලපරාක්‍රමයට ගොදුරු වන බව පැවසීමෙනි. ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා විසින් දාර්ශනිකව විධායක ජනාධිපති ක්‍රමය ප්‍රශ්න කළේය.

එතැන් සිට දේශපාලන නායකත්වයන්, ආගමික නායකයින්, සමාජ ක්‍රියාකාරීන් විධායක ජනාධිපති ක්‍රමයට එරෙහිව වරින් වර උද්ඝෝෂණ කරන ලදහ. 1994 සිට 2015 දක්වා සෑම ජනාධිපතිවරණයකදීම එය අහෝසි කරන බවට සියලු පක්ෂවල ප්‍රමුඛ මැතිවරණ පොරොන්දුව විය. එහෙත් බල හුවමාරුවත් සමග එය පොරොන්දුවක්ම වී ඉතිහාසයට එක්විය. 2001 චන්ද්‍රිකා කුමාරතුංග මැතිණියගේ ආණ්ඩුව ඉදිරිපත් කළ 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් විධායක ක්‍රමයේ කිසියම් බල කප්පාදුවක් පමණක් සිදුකළාය.

2005 පුළුල් ජනතා පෙරමුණකින් ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රමුඛ මැතිවරණ පොරොන්දුවද ඒකාධිපති ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවය. (මහින්ද චින්තන 84 පිට), එහෙත් තම ප්‍රථම ධුරකාලය තුළ එය අහෝසි කිරීමට කිසිම සාධනීය පියවරකට නොපිවිසුණි.

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ 2010 ජනාධිපතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහිද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට අන්තර්ගත කළේය. (මහින්ද චින්තන ඉදිරි දැක්ම 53 පිටු), එහෙත් ජනතා අභිලාෂයන් මත තැබූ පොරොන්දු ඉටුකිරීම වෙනුවට 17 වන සංශෝධනය මගින් පාර්ලිමේන්තුවට පවරණ ලද බලතල ද අහෝසි කර යම් පුද්ගලයෙකු ජනාධිපතිවරයෙකු වීමේ උපරිම වාර ගණන සීමාව ද බිඳ දමා ඕනෑම වාර ගණනක් ජනාධිපතිවරයෙකු ලෙස පත්විය හැකි පරිදි සංශෝධන කර ගන්නා ලදී. එතෙක් ස්වාධීනව තිබූ කොමිෂන් සභා අක්‍රිය කරනු ලැබීය. එය 18 වන සංශෝධනය ලෙස ඉතිහාසයට එක්ව ඇත. එතැන් සිට තනි පුද්ගල බල උමතුවකට රට ගොදුරු වූ අතර ඊට එරෙහිව වියත් සමාජ ක්‍රියාකාරීත්වයන්, දේශපාලන පක්ෂ, සංවිධාන දැඩි ක්‍රියාමාර්ග යන්ට පිවිසුනහ.

සමස්ත රටම විධායක ජනාධිපති ක්‍රමයට එරෙහිව ගොනුවන්නට වූ අතර පොදු සමාජ ඉල්ලීම වූ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන සැබෑ නායකයෙකු වටා රට පෙළගැසීමට නියමිත විය. රටේ ජන අභිමතය නියෝජනයට පැමිණි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන්ව ජනාධිපතිවරයා ලෙස ඉහළින්ම ලාංකික සමාජය අනුමත කරන ලදහ.

ඒකාධිපති බලතල සහිත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ලාංකික ජනයාගේ අරගලයට දශක තුනක් ඉකුත් විය.

ජනවාරි 8 වැනිදා ලාංකික දේශපාලනයේ හැරවුම් සළකුණක් සටහන් වූ දිනයකි. ඒ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලාංකික ජනතාවගේ නව භාරකරුවා ලෙස පත්කර ගත් දිනය වීදිනය. එතුමා විසින් තමා සතු බලය අත්හැරීමේ ලියවිල්ල ලෙස 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේය.

බලය උදෙසා පුද්ගලයන් කළ අරගලයන්හි තොරතුරුවලින් ලෝක ඉතිහාසය පිරී ඇත. මෙරට හා ලෝක දේශපාලන තුළ බලය අත්පත් කර ගත් සෑම නායකයෙක්ම උත්සාහ දරන ලද්දේ සතු කරගත් බලය තහවුරු කර ගැනීමට හා පුළුල් කර ගැනීමට වෙහෙසීමේ ක්‍රියාවලියයි. තම බලය අත් හැරීමේ දුලබ ගණයේ අභිනව ආදර්ශයක් ලෝකයට සපයන ලද්දේ මෛත්‍රීපාල සිරිසේන නම් සැබෑ ජනතා නායකයා වෙතිනි.

බලකාමයෙන් අන්ධ වූ පසුගාමීත්වයෙන් ආතුර වූ පරාජිත දේශපාලන චරිත 19 වන ව්‍යවස්ථා සංශෝධනය පරාජය කිරීමට දැඩි ලෙස වෙහෙස වුවද මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ තම බලහරණය උදෙසා අප්‍රතිහත ධෛර්යයෙන් හා අධිෂ්ඨාන සහගත කැපවීමේ ප්‍රතිපලය ලෙස 19 වන ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව තුළ සම්මත කර විධායක ජනාධිපතිධූරය ප්‍රජාතන්ත්‍රීය කර දශක තුනක ලාංකීය ජනයාගේ අභිලාෂය සපුරන ලද්දේය.

## එහිදී විධායක ජනාධිපති ක්‍රමයේ තිබූ බලගතු බලතල සංශෝධනය කළ අයුරු

- අවුරුදු 06 ක ජනාධිපති ධූර කාලය 05 කට සීමා කිරීම
- අනන්තය දක්වා ඇති ධූර කාල රාමුව 02 කට සීමා කිරීම
- මුලික අයිතිවාසිකම් නඩු ජනාධිපතිට එරෙහිව පැවරීමට ඉඩ සැකසීම
- මහමැතිවරණයක් පවත්වා වසරක් ගතවූ පසු ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිට තිබූ බලය පාර්ලිමේන්තු බහුතර කැමැත්තට පැවරීම
- ජනාධිපතිවරයාගේ අභිමතය පරිදි නිමක් නැතිව පත්කළ අමාත්‍ය මණ්ඩලය 30 කට සීමා කිරීම
- අමාත්‍යාංශ ලේකම්වරු තම අභිමතයට පත්කිරීමේ බලතල ඉවත්කිරීම
- ඕනෑම අපරාධකරුවෙකුට සමාව දීමට ජනාධිපතිවරයාට තිබූ හැකියාව අහෝසි කිරීම
- උපරිමාධිකරණ, අභියාචනාධිකරණ, ශ්‍රේෂ්ඨාධිකරණය, වැනි ඉහළ අධිකරණ සඳහා විනිසුරුවරුන් පත් කිරීමේ බලතල ජනාධිපතිවරයාගෙන් ඉවත් කිරීම

# නිදහසට අරුමැසි කොමිෂන්

පුස්තකාලය

18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් විසුරුවන ලද කොමිෂන් සභා 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් යළි ව්‍යවස්ථා ගත කර රටේ ප්‍රජාතන්ත්‍රවාදය රෝපණය කිරීමට ඉඩ සලසන ලදී. ස්වාධීන කොමිෂන් සභා පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපිත කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් ස්වාධීන කොමිෂන් සභා 10 ක් පත් කරලීමට ක්‍රියාකර ඇත.


01. මැතිවරණ කොමිෂන් සභාව
02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව
03. ජාතික පොලිස් කොමිෂන් සභාව
04. විගණන සේවා කොමිෂන් සභාව
05. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
06. අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව
07. මුදල් කොමිෂන් සභාව
08. සීමා නිර්ණය කොමිෂන් සභාව
09. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව
10. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

මෙම කොමිෂන් සභාවලට සාමාජිකයින් පත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුත්තේ ජාතික ව්‍යවස්ථා සභාව වේතය. මීට පෙර ජනාධිපතිවරයා තම අභිමතය පරිදි පත්වීම් කර එකී සාමාජිකයන් තම වහල් භාවයට යටත් කරන ලදී. ව්‍යවස්ථාදායක සභාව නිර්දේශිත නාමයන් ජනාධිපතිවරයාට නොසලකා සිටීමට නොහැකි අතර තම අභිමතය පරිදි සාමාජිකයන් පත් කිරීමට නොහැකි වන ලෙස ප්‍රතිපාදන ව්‍යවස්ථාව මගින් තහවුරු කරන ලදී.

මෙම කොමිෂන් සභා ස්ථාපනය කිරීමෙන් ප්‍රබුද්ධ රාජ්‍ය සේවයක් මෙන්ම සමස්ත සමාජයම ප්‍රජාතන්ත්‍රීයකරණයට යළි හසුකරලීය. මින් පුළුල් විෂය පරාසයක් ආවරණය කර රාජ්‍ය සේවකයන්ට නිදහස සපයා ඇත. බලය හමුවේ කොඳු බිඳ නොගන්නා නිලධාරි තන්ත්‍රයක් බිහිවීමට මග විවර කර ඇත. මින් රට වේගවත් ගමනකට මංපෙත විවර කැලීමේ අභිලාෂය සපුරාලනු ඇත.

වර්තමාන ලාංකික සමාජය වියත් ප්‍රබුද්ධ සමාජයකි. වැඩවසම්වාදී ගෝත්‍රික සිරිතට, ප්‍රතිපත්තින්ට නියෝජනයක් තවදුරටත් නොමැත. රාජ්‍ය තන්ත්‍රය වඩාත් පිරිපුන් ලෙස හසුරුවාලිය හැක්කේ තනි ආඥාදායක උමතුවකින් නොව වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සම්මුතිවාදී සංවාද හා කතිකා ඔස්සේය. වහල්කම නිදහස සේ සැලකූ සමාජයේ පැතිකඩක් රට තුළ තවදුරටත් නියෝජනය වුවත් සාතිශය බහුතරය මානවීය නිදහස අපේක්ෂාවෙන් පෙළෙති. එකී ධර්මතාවය ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කරලීම ඔස්සේ තහවුරු කර ඇත. මෙහි ඵලය අනාගතය විසින් නෙළා ගනු ඇත.







# සංහිඳියා ආණ්ඩු කරණයක උදාව

ප්‍රධානතම දේශපාලන ධුරාවලි දෙක අතර ජාතික සම්මුතික ආණ්ඩුකරණය ගැන ශ්‍රී ලාංකිකයින්ට අත්දැකීමක් නොවීය. නිදහස දිනා 67 වසරක් ආණ්ඩුකරණය ක්‍රියාත්මක කරන ලද්දේ එකිනෙකාට එරෙහි වෛරී ප්‍රතිපත්තියකට අනුගතවය. "අපි ආවොත් තොපි ඉවරයි, තොපි ආවොත් අපි ඉවරයි" යන්න ප්‍රධාන තේමාව යටතේ පාලනය ක්‍රියාත්මක විය. ජාතික ප්‍රතිපත්ති, රාජ්‍ය ප්‍රතිපත්ති, සංවර්ධන ව්‍යාපෘති සියල්ල ද එකිනෙකාට එරෙහිව විය. ජාතික අභිලාෂයන් තහවුරු කර රට ඉහළට ඔසවා තැබීමට තරම් ප්‍රබුද්ධ දේශපාලන කථිකාවතට පිවිසීමට අසමත් වීමෙන් රටතුළ මතු වූ ගැටලු විසඳීමට නොහැකි විය. මින් ගැටලු සංකීර්ණය වී රට අඳුරට ගොදුරු විය.

මුළු රටම ජාතිය අද්දර ඇති ගැටලු විසඳා ගැනීම උදෙසා ප්‍රධාන පක්ෂ දෙක අතර ජාතික සංහිඳියා ආණ්ඩුවක අවශ්‍යතාවය මතු කෙරිණි.

ජාත්‍යන්තර සමාජය තුළින් ශ්‍රී ලංකාවට එරෙහිව එල්ලවන විවිධ මාදිලියේ තෙරපුමට මුහුණ දිය හැක්කේ ද එවැනි සම්මුතික ආණ්ඩුවක් වෙතින් යන්න ප්‍රබුද්ධ ජනමනසේ පිළිගැනීම විය. මේ ජන අභිලාෂය සපුරන ලදී. එය නිදහසින් පසු වසර 67ක දේශපාලන ඉතිහාසය තුළ ලද ප්‍රථම හා ප්‍රබල දේශපාලන අත්දැකීම වී ලෝකයටම ආදර්ශය සපයයි. ලෝක දේශපාලන ශබ්ද කෝෂයට සිද්ධාන්තයක් සපයනු ලබයි.

පක්ෂ වියගසින් ආතුර වූ හැඟුම්බර අදේශපාලනික ගුඪ චරිත ජාතික සංහිඳියා ආණ්ඩුව කෙරෙහි රුදුරු විවේචන මතු කළ ද දසක ගණනාවක් ලාංකික සමාජය පෙළෙන ලද ගැටලු විසඳීමට උත්සුක වනු ඇත. එය ප්‍රජාතන්ත්‍රීය සංකල්ප ප්‍රවර්ධනයට ලක්කර රටේ මානව නිදහස ගැඹුරට තහවුරු කරනු ඇත්තේය.

ප්‍රජාතාන්ත්‍රික පිළිවෙත නිසා ජාත්‍යන්තරය තුළින් මෝදුවන සුහදශීලිත්වය සපුරා තහවුරුවනු ඇත. දැනටම ලෝ පතළ රාජ්‍ය නායකත්වයන් ලංකාවට මිත්‍රශීලි හස්තය දිගුකිරීම මෙය තහවුරු කරන්නකි.

ජාතික සංහිඳියා ආණ්ඩුව දේශපාලන අධිෂ්ඨානයක් සහිත දෘෂ්ටිවාදයකින් ක්‍රියාකරනු ඇත. ඊට අවශ්‍ය නිර්භීත බව මෙන්ම දේශපාලන ශික්ෂණය ද සහිතය. කිසිවිටෙක ජාතික අභිලාෂයන්ට එරෙහිව කුමන්ත්‍රණකරුවන්ගේ ගොදුරක් වීමට ඉඩ සපයන්නේ නැත. ප්‍රදර්ශනවාදී, ගෝත්‍රිකවාදී, දේශප්‍රේමී සළු වලින් වසා නොගත් සැබෑ දේශප්‍රේමීත්වයෙන් විකසිතව සකල ලාංකිකයන්ගේ අභිලාෂයන් සපුරාලීමට ජාතික සංහිඳියා ආණ්ඩුව උත්සුක වනු ඇත්තේය.



Sri Lanka's National Newspaper
LATE CITY
WATERSHE
19A changes destiny of Sri La
PARLIAMENT CREATES HISTORY
ඓතිහාසික 19
ඉහළින්ම
සම්මතයි
www.ada.lk
අද
212
29 APRIL
MAIT
CHANGE
CONSTIT
PASS


ජනාධිපති කාර්යාලය
පුස්තකාලය
මව්බිම
ජේ.ආර්.ගේ
ව්‍යවස්ථාව
මෛත්‍රීපාල
වෙනස් කරයි
JR's



# සුවසෙතට විවර කළ මග

අප නිදහස අත් කර ගැනීමෙන් අනතුරුව විවිධ රජයන් ක්‍රියාත්මක කරන ලද සෞඛ්‍යය ප්‍රතිපත්තීන් නිසාවෙන් කලාපයේ අන් රටවල් හා සැසඳීමේදී සෞඛ්‍යය ක්ෂේත්‍රය තුළ ඉහළ මට්ටමක් නියෝජනය කළේය. එහෙත් පසුගිය දශකයකට ආසන්න කාලයක් සිට ලංකාව ඖෂධ මාෆියාවේ ගොදුරක් විය. සපුරා ආණ්ඩුකරණය ඖෂධ වෙළෙන්දන්ගේ අත්අඩංගුවට පත්විණි. දුගී ජනයා පමණක් නොව ආර්ථික සවියක් ඇති අය පවා මින් පීඩාවට පත් වුණි.

මේ නිසාවෙන් දශක හතරහමාරකට වැඩි කාලපරිච්ඡේදයක් සංවාදගතව තිබූ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය සම්බන්ධ ඉහළ ඉල්ලුමක් රට තුළින් මතු විය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ රාජ්‍ය සමය තුළ ඖෂධ සංස්ථාව පිහිටුවාලීමට මූලිකත්වය සපයන ලද මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමන් හඳුන්වා දෙන ලද ජාතික ඖෂධ ප්‍රතිපත්තිය එහි පදනම් විය. එහෙත් එය පාර්ලිමේන්තුව තුළ සම්මත වීමට ක්‍රියාමාර්ගයක් නොවිණි. 2010 වසරේ සිට මේ සඳහා උනන්දු වී 2011 වන විට එකී ප්‍රතිපත්තියට යම් සාධනීය වැඩකොටසක් නිමවන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීමකදී කරන ලද හෙළිදරව්වෙන් පසු ජාතික ඖෂධ පනත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේදී අතුරුදහන් විණි. ඖෂධ සමාගම් හාරසිය ගණනකින් එක් සමාගමකින් රුපියල් ලක්ෂ 25 බැගින් ගෙන ඖෂධ පනත අතුරුදන් කළ බව පසුව හෙළිදරව් විය.
දැන් ලෝකයේ පවතින අවි ආයුධ වෙළෙඳාම හැරුණු විට බලගතුම වෙළෙඳ අධිකාරිය ලෙස අත්පත් කරගෙන ඇත්තේ ඖෂධ වෙළෙඳාමය. එබැවින් එය වාණිජ මාෆියාවකි. ප්‍රමිතියෙන් තොර ඖෂධ ආනයනය, බෙදාහැරීම, අලෙවිය, ලංකාව තුල දූෂණයෙන් ඉහ වහා ගියේය. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආයතනවල අධිපතීත්වයට පත් කරන ලද්දේ අති දූෂිත චෞර රජුන්ය. විධායකය පමණක් නොව එකී නිලධාරීන් ද ඇමතිවරයා නොතකා කටයුතු කළේය. නිලධාරීන්ගේ වංචා දූෂණ වසා ඔවුන් රකින තැනකට විධායකය පත්විණි. සෞඛ්‍ය ඇමතිවරයාව නිලධාරි හමුවේ බාල්දු කරන ලදී. නාමිකව සෞඛ්‍ය ඇමතිවරයෙකු පත්කර තනි පුද්ගල ආඥාදායකත්වයක් විසින් මුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයම හසුරුවන ලදී.

ජනයාගේ ජීවිතය නිරෝගී දිවියකට යොමුකරලීම වෙනුවට ඔවුන්ගේ ජීවිතය උකසට තබා තම පවුල් කවයේ සුඛවිහරණය සඳහා ප්‍රකෝටි ගණනින් ධනය සපයා ගන්නා උල්පතක් බවට සෞඛ්‍ය ක්ෂේත්‍රය පත් කර තිබුණි. මින් ජනතාව විඳි පීඩනයෙන් ගලවා ගැනීමේ උතුම් පාරමිතාවෙන් දශක හතරහමාරක් සාකච්ඡාවකට සීමා වූ ඖෂධ පනත ඉදිරිපත් කරන ලදී. එය මාර්තු 06 වැනිදා සම්මත කර මහාචාර්ය සේනක බිබිලේ මැතිඳුන්ගේ හා සුවහසක් අහිංසක රට වැසියන්ගේ බලාපොරොත්තුව සඵල කරන ලදී.


මතින් නිදහස්

# දුම්වැටියෙන් දැවුණු දැය මුදවාලීම

දුම්වැටි හා මත්ද්‍රව්‍ය විසින් දශක කිහිපයක සිට ශ්‍රී ලාංකික සමාජ දරුණු ලෙස ගිල ගෙන තිබුණි. එය වසංගතයක් ලෙස ගම් දනව් කරා ව්‍යාප්ත වී සමාජ විනය ද බිඳ දැමුණි. අඩු ආදායම්ලාභී පවුල් ඒකකවල ආදායමෙන් තුනෙන් එකක් මධ්‍යසාර හා දුම්වැටි භාවිතයට යොමු කෙරී ඇත. දුගීකම දුරලීම අරභයා ආණ්ඩු වැය කළ සමෘද්ධි, දිවි නැගුම වැනි සමාජ සහනාධාර ව්‍යාපෘතියට වඩා දසගුණයකට වැඩි මුදලක් ජනයා විසින් දුම්වැටි හා මධ්‍යසාර මත්කුඩු සඳහා වැය කෙරිණි.

දුම්වැටි හා මධ්‍යසාර භාවිතා කර රෝගීවූවන් වෙනුවෙන් සියයට 22 ක් සෞඛ්‍ය වියදම්න් වැය කිරීමට සිදුව තිබුණි. සමාජ සාමයට පුරුෂාර්ථයන්ට හානි කරන සංවර්ධනය අඩාල කරන දුම්වැටි හා හා මධ්‍යසාර භාවිතයට එරෙහිව සංවර්ධිත රටවල් විවිධ වූ ක්‍රියාමාර්ග ගෙන මධ්‍යසාර හා දුම්වැටි භාවිතාව අඩ පණ කර ඇත. ශ්‍රී ලංකාව වැනි දුගී රටවල් දරුණු ලෙස දුම්කොළ සහ මධ්‍යසාර භාවිතයට ගොදුරු ව පවුල් සංස්ථාව ද සමාජ චින්තනය ද වනසමින් තිබුණි. විවිධ සමාජ ස්ථරයන් පවා මෙය ප්‍රචලිත කිරීමට යොදා ගනු ලැබීය. ජාතික ආදායම ලබා ගැනීමට ආණ්ඩු විසින් මේ දුරාචාර ව්‍යාපෘතිය අනුගමනය කිරීමට තරම් නිහීන විණි.

සිවිල් සමාජය ආගමික සංස්ථාවන්ගේ විරෝධතාවය නිසා 2006 දී සම්මත කර ගත් දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ අධිකාරී පනත රටට යම් විශ්වාසයක් ජනිත කරන ලදී. නමුත් බලකාමී පවුල් කවයක අශ්‍රද්ධායකත්වය විසින් එය ක්‍රියාත්මක ධුරාවලියක් වීම අත්හිටුවන ලදී. මගේ මැදිහත් වීමෙන් පාර්ලිමේන්තුව සිගරැට් බහලුමේ (පැකැට්ටුවේ) සියයට අසූවක රූපමය අවවාද දැමීමේ රෙගුලාසිය සම්මත කරන ලදී. දුම්වැටි භාවිතයෙන් වසරකට 15,000 ක් ලාංකික ජනයා පෙනහළු පිළිකාවෙන් හා මුඛ පිළිකාවෙන් මිය ගියහ. එකී ජනයාගේ සෝ සුසුම් කඳුළු වෙනුවට දුම්කොළ සමාගම් මතින් ලැබෙන ප්‍රකෝටි ගණනක් ධනයට ලෝභීව වසර දෙකක් රූපමය අවවාද රෙගුලාසිය යටපත් කෙරුණි. මේ හේතුවෙන් දුම්කොළ සමාගම් සමග කළ අරගලය උසාවිය මගින් විසඳා ගැනීමට වසර දෙකක් අධිකරණය බංකු මතහිඳ කාලය මරමින් කඳුළු සලමින් බලා සිටීමට සිදු විය. ප්‍රකට මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් රකින තැනකට ආණ්ඩුව පත්විණි. රාජ්‍ය අංශයෙහි ඉහළ නිලදරන්නන් මත්ද්‍රව්‍ය ජාවරම්කරුවන්ගේ තුරුලේ නැටවුණි. මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ අනුහසින් ආණ්ඩු මෙහයෙවන මධ්‍ය හසුරුවන සිවිල් සමාජ නටවන සමාජ මාපියාවක් බවට පත්වුණි. කොටින්ම එතනෝල්කරුවන් පාර්ලිමේන්තුව පමණක් නොව කැබිනට් මණ්ඩලය ද විනිවිද ගොස් තිබුණි.

මේ දුම්වැටි විරෝධී අරගලයට නායකත්වය සැපයීම නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට වාර්ෂික වෙන් කරන ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශයත් මහා භාණ්ඩාගාරයත්, සංවිධානාත්මකව කපා හැරිණි.

අධිකරණයට කළ දැඩි බලපෑම් හරහා ලංකාවේ උත්තරීතර මහජන ආයතනය වන පාර්ලිමේන්තුව අනුමත කළ සියයට 80 රූපමය අවවාදය සියයට 60 දක්වා අඩු කරන ලදී. එය සියයට 80 ක් කිරීමේ ප්‍රතිපත්තිය දින...... යළි පාර්ලිමේන්තුව මගින් සම්මත කර ජාතිය හමුවේ තැබූ පොරොන්දුව ඉටු කරන ලදී.



# වස විස සුන් කෙතකට මාවත

ශත වර්ෂ ගණනාවක් ශ්‍රී ලාංකික ජනයාගේ ආහාර අවශ්‍යතා සපුරන ලද්දේ දේශීයව ගොඩ නංවා ලද ස්වයං පෝෂිත ආහාර රටාවක් මගිනි. හෙළදිව ධාන්‍යාගාරය ලෙස ප්‍රචලිත වූයේ එබැවිනි.

බටහිර ජාතීන් ලංකාවට කඩා වැදීමෙන් අනතුරුව ස්වයංපෝෂිත ආර්ථික රටාව බිඳ දැමුණි. ඒ වෙනුවට බටහිර අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය භෝගයෙන් ප්‍රචලිත කිරීමේ ඒකායන අරමුණ බවට පත්විණි. එහෙත් නිදහසින් පසු ආණ්ඩු කළ විවිධ රජයන් විසින් කෘෂි කර්මාන්තය නගා සිටු වීම අරභයා විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කළේය. කළ දැවැන්ත වාරි මාර්ග ක්‍රම ඊට ශක්තිය සපයන ලදී. කෘෂි කර්මාන්තය අරභය විවිධ පර්යේෂණ නිර්දේශ ඉදිරිපත් වූ අතර රසායානික පොහොර සහ බෙහෙත් අධික ලෙස පසුගිය දශක කිහිපය තුළ යෙදවිණ. කෘෂි භෝගයන් හා ඵලදායිතාව සීඝ්‍ර වර්ධනයට එය ඉවහල් වුවද බරපතල රෝග ගණනාවකට ගොවියා ගොදුරු වීමට යොදන ලද රසායනික තෙල් පොහොර හේතු විය. මහවැලි කලාපය තුළ ගොවි ගෙවිලියන් මාරාන්තික වකුගඩු රෝගයට ගොදුරු වූ අතර ඒ සඳහා බලපෑ සාධකය ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය හා ලාංකික විද්වතුන් විසින් සොයා ගනු ලැබුවේ පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍ය එකී ප්‍රදේශවල පවතින කිවුල සහිත ජලය සමග මුසු වීම බවයි. ගොවියාගේ වකුගඩු මරණයට පත් කරන ආසනික් කැඩ්මියම් අඩංගු කෘෂි රසායනික ද්‍රව්‍ය පාලනයට පියවර නොගත් අතර ජාතියට බත සපයන ගොවි ගෙවිලියන් ලක්ෂ දෙකක් මිය යාමට දින ගනිමින් සිටීමට ඉඩහරින ලදී.
මීට විසඳුම් ලෙස සහමුලින්ම විදේශ තෙල් පොහොර සමාග ම්වල අත්අඩංගුවෙන් මිදීමට ආණ්ඩුව කිසිදු ක්‍රියා මාර්ගයක් නොගත්තාය.

ඒ වෙනුවට වකුගඩු රෝගයට ගොදුරු වූවන් වෙත ප්‍රතිකාර ගැනීමට මුදල් ලබාදීමේ අමන ක්‍රියාවලියක් නිර්දේශිත විය. වකුගඩු රෝගයට අතිරේකව පිළිකා හා හෘද රෝග වැනි බරපතල රෝග ව්‍යාප්තියට කෘෂි රසායනික ද්‍රව්‍ය බලපා ඇති බව අනාවරණය වී ඇත. එබැවින් වකුගඩු රෝගය ඇතුළු රෝගයන්ට හේතු වෙන බවට හෙළි දරව් වූ කෘෂි රසායනික ද්‍රව්‍ය ආනයනය, බෙදා හැරීම වහාම තහනම් කරන බවට ජාතික අබිමුව තැබූ ප්‍රතිඥාව ජාතියේ හිත සුව පිණිස ක්‍රියාත්මක කරන ලදී.

සාම්ප්‍රදායික කාබනික පොහොර හා පලිබෝධනාශක භාවිතයට දෑ ගොවියා පෙළඹවීම උදෙසා සහනාධාර ක්‍රම ඇතුළු විවිධ ක්‍රියා මාර්ග ගන්නා ලදී.


YAHAPALANAYA
INDIA
USA
CHINA
RUSSIA
19
START
13.04.2015

# භාෂණයේ නිදහසට එළඹුමක්

ප්‍රජාත්‍රන්තික සමාජයක මූලික කොන්දේසියක් ලෙස භාෂකයේ නිදහස ප්‍රමුඛය. එය මානව සමාජයේ සුරක්ෂිතතාව උදෙසා එළඹුමක් සපයයි. ජාත්‍යන්තර සබැඳියාව අරභයා භාෂණයේ නිදහස ප්‍රබල ප්‍රතිපත්තියක් ඇත. සෑම මිනිස් ක්‍රියාකාරකමක්ම වර්තමානයේ ජනාමාධ්‍ය විසින් කළමනාකරණය කරයි. වෙළඳ අරමුණු තහවුරු කිරීම වෙනුවෙන් සහ සමාජ හර පද්ධතීන් බිඳ දැමීමෙහිලා ජනමාධ්‍ය ප්‍රමුඛ මෙවලමක් ඇති බවට නැගෙන චෝදනා එමට වුවද ප්‍රජාතන්ත්‍රිය සමාජ අවකාශය තහවුරු කරලීම් වස් මාධ්‍ය නිදහස පූර්ණ ලෙස තහවුරු විය යුතු යැයි දැඩිව පිළිගැනේ. අප රජය ඊට අනුගතව ප්‍රතිපත්තීන් නියාමනයන් සැකසීම සපුරා ඇත.

ජනමාධ්‍ය ආයතන හිමිකාරිත්වය හා මාධ්‍යවේදීන් සෘජු හෝ වක්‍රව මර්දනයට හසු නොකර පූර්ණ නිදහස උදා කර ඇත. ජනමාධ්‍යවේදීන් ගේ සුභ සාධනය පිණිස නිවාස ව්‍යාපෘති, යතුරු පැදි ප්‍රදාන වැනි ක්‍රියාවලින් සක්‍රීය කර ඇත. දහක ගණනාවක මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන්ගේ දැඩි ඉල්ලීමක් වූ ජාත්‍යන්තර ප්‍රජාවගේ ආයාචනයක් වූ තොරතුරු දැන ගැනීමේ පනත යථාර්ථයක් කිරීමට මං පෙත් විවර කරන ලදී.

එය මේ වන ගැසට් කර ඇති අතර නුදුරේදී පාර්ලිමේනතුවේදී සම්මත කර රට හමුවේ තැබූ ප්‍රතිඥාව තහවුරු කරනු ඇත. මින් මාධ්‍යවේදීන්ට නිර්භයව තම මෙහෙවරට දායක වීමට මග විවර වනු ඇත. මාධ්‍යවේදීන් හිතියට ලක් වූ සුදු වෑන් මාපියා කල්ලිය සපුරා මර්දනය කර සකල මාධ්‍ය වේදීවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත කරන ලදී. පාර්ලිමේන්තු සභා රැස්වීම සජීවිව රූපවාහනී මාධ්‍යයෙන් විසුරුවා හැරීම් ආරම්භ කරන ලදී. නොමිලේ අන්තර්ජාල පහසුකම් ලබා දීම සඳහා වන ව්‍යායාමය බොහෝ නගරවල ආරම්භ කර ඇත.

වත්මන් ආණ්ඩු සමය තුළ මැති ඇමතිවරුන් පමණක් නොව ජනාධිපතිවරයාව ද දැඩි විවේචනයට නතු කිරීමට ඉඩ විවර කර ඇත. පසුගිය දිනවල ලංකාවේ පවත්වන ලද විදේශීය ගායකයෙකුගේ ප්‍රසංගයක් සම්බන්ධව දැක්වූ සංස්කෘතිකවාදී අදහසට එරෙහිව නිර්දය විවේචන සමාජ ජාල වෙබ් අඩවි හරහා ලක් කෙරුණි. පසුගිය රාජ්‍ය සමය තුළ ජනාධිපතිවරයා නොව ඔහුගේ සමීප සාමාජිකයෙකු හෝ කිසිම විවේචනයකට භාජනය කිරීමට සමාජය නිර්භය නොවිණි. එසේ කළේ නම් ප්‍රගීත් එක්නැලිගොඩට අත් වූ ඉරණමම තමන්ට උරුම බව දන්නා බැවිනි. දැන් මාධ්‍යවේදීන්ගේ අතපය කට කපන්නේ නැත. මාධ්‍යවේදීන් රටින් පලායන්නේ නැත. අභය සමාජයක් නිර්මාණය කර ඇති බැවින් මාධ්‍ය ඉන් උපරිම ඵල නෙළා ගනිමින් සිටී.

සමාජ වෙබ් අඩවි සහ සියලු මාධ්‍යයන් ජනාධිපතිවරයා නිර්දය විවේචනය කරන තැනකට මාධ්‍ය නිදහස තහවුරු කර ඇත.



# හරිත දැයකට මං පෙත

ගහ කොළට සිපාවන්ට මෙත් වැඩුණු චින්තනයක අනුහසින් ගොඩ නැගුණු පරිසර වියමනක් ශ්‍රී ලාංකිකයා සතු විය. මිහිඳු මහ රහතන් වහන්සේ දෙසුම වූයේ පාලකයා පරිසරයේ බාර කරුවා බවය. සකල ජීවී අජීවීන්ට එය උරුම බව එකී දේශනාව තුළ අන්තර්ගත විය. රතු ඉන්දිය පරිසර නායකයාගේ මුවින් ගිලිහුනේ සුසුම ද සැනසුම ද ජිවිතය ද සියල්ල ස්වභාව පරිසර පද්ධතිය බවය. මේසා බර සාර චින්තන සමුහයකින් ශ්‍රී ලාංකික අපගේ පරිසරය හා සහජීවන පිළිවෙත හැඩ ගැසුණි.

ස්වභාවධර්මය සමග අනුගත ජීවන විලාසිතාවක අසිරිය ලාංකිකයන් වූ අප අත්විඳීය. එහෙත් බල මදිරාවෙන් උමතු වූ පරිසර පද්දතියේ සමතුලිතාවය බිඳ වැටෙන සංවර්ධන රටාවකට රට යටත් කළේ ඉන් රට සංවර්ධන කිරීමට වඩා අතිවිශාල මුදල් ගසා කෑමේ කෑදර අභිලාශයෙනි. වැසි වනාන්තර මැද මහා මන්දිර හෝටල් නමින් ඉදි කළේය. ගහ කොළ වනසා දැමිණි. වන ජීවීන් ධනවතුන්ගේ බලවතුන්ගේ භෝජනයට ගොදුරු කිරීමට ඉඩ හැරියේය. මහ බල ඇතුන් වෙඩි කා වැටුණේ තම දළ යුගල නිසාවෙනි. වන ඇතුන් මංකොල්ලය රාජ අනුමැතිය ලද ව්‍යාපාරයක් වී කෝටි ගණනකට මිල නියම විය. වැලි පස් ජාවාරම ද එලෙස ඉරණමකට ගොදුරු විණි. නිදහසේ ඉහළට ගත් හුස්ම පොද විනාශ කෙරිණි. සා පිපාසාව නිවාගත්ත ජලයට වසවිස කෘෂි රසායනික නමින් මුසු විමට ඉඩ දී නිහඬ විය.

මෙගා සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් කිසිදු පරිසර ඇගයීමක් නොවීය. මහ වන අලි නිවෙස් තුළ ගුවන් තොටුපළවල් ඉදිවුණේ එහෙයිනි. මෙගා නගර ඉදිකිරීම් අරඹා රට මහ සයුරට බිලි දී ඇත්තේ එබැවිනි. ලෝක ශිෂ්ටාචාරයන්ට ලංකාව විසින් සපයන ලද ආදර්ශමත් පරිසර දැක්ම අහෝසි කරන ලදී.

ඉතා දුෂ්කර ව්‍යායාමයක් වුවද පරිසරය සුරකීමේ අනුලංඝනීය වූ වගකීමට අප රජය උර දී ඇත. වනාන්තර, වන සතුන් රැකීම හා විනාශය වැළැක්වීමට දැඩි ක්‍රියාමාර්ග සපයන ලදී. සියලු පරිසර නීති ක්‍රියාත්මක කිරීම උදෙසා වූ යාන්ත්‍රණ ශක්තිමත් කරන ලද්දේය. කිනම් බල ධුරාවලියකට වුවද පරිසර නීති බිඳ දැමීමට ඉඩ අහුරන ලදී. 2016 ජනවාරි 01 වෙනදා සිට පොලිතීන් භාවිතයට දැඩි නීති ක්‍රියාත්මක කරන ලදී. පිළිකා අඩංගු බවට සෞඛ්‍ය අංශ අනතුරු අඟවා ඇති ඇස්බැස්ටස් තහනම 2018 දී සිට ක්‍රියාත්මක කිරීමට නියාමන සකස්කරන ලදී.

අපගේ ජෛව විවිධත්ව සම්පත රැකගැනීම වෙනුවෙන් රාජ්‍ය ආයතන සමග ත්‍රිවිධ හමුදාව ගොනු කරන ලදී. පරිසරය සමග සහජීවන ප්‍රතිපදාව සියලු රටවැසියන්ගේ ප්‍රතිපත්ති බවට තහවුරු කරන ලදී.



# වල්වැදුණු නීතියට විරාමය

මානව සමාජයක, රටක අභිවෘද්ධිය පවතින්නේ ඒ සමාජය, රට කෙතරම් නීතිගරුක වන්නේ ද නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම අරභයා කෙතරම් ප්‍රතිපාදන සපයා ඇද්ද යන කරුණු මතය. ශ්‍රී ලාංකික සමාජය ස්වාභාවිකවම නීතියට යුක්තියට දේවත්වයෙහිලා සැලකීමට හුරු වූ සමාජයකි. එය බිඳවැටී නීතිය අතට ගැනීමට ජනයා උත්සුක වන්නේ බල ආධිපත්‍ය විසින් නීතිය පසඳලීමේ ව්‍යුහයන් බිඳ දැමුණු කල්හිය. මෙවැනි ඛේදනීය සිදුවීම් සමූහයක අත්දැකීම් පසුගිය වසර කීපයක සිට ශ්‍රී ලාංකික සමාජය අත්විඳින ලදී.

අධිකරණ හා නීති ක්ෂේත්‍රයට එරෙහි තම බලඅධිකාරිය විධායකය විසින් විහිදුවන ලදී. විධායකය කැමැති තීන්දු රටේ නීතිය විය යුතු විය. එසේ නොවූ විට අධිකරණයට විනිසුරන්ට නීතිඥයන්ට නන්විධ අතවරයන්ට මුහුණදීමට සිදුවිය. පැය 48 වැනි කෙටි කාල විමර්ශනයකින් අග්‍රවිනිශ්චයකාර පදවියක් පළවා හැරි ඉතිහාසය අපගේ නීති ක්ෂේත්‍රයට පසුගිය සමය තුළ එකතු විය. විධායකයට සුවච කීකරු අය නීති ක්ෂේත්‍රයේ ඉහළ ධුරාවලින්ට පත් කෙරිණි.

සුදුසුකම නොව තමා වටා භ්‍රමනය වන අයට ජනාධිපති නීතිඥයන් ලෙස උසස් වීම් ලැබුණි. නිදහස් මනසකින් අධිකරණ ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට කටයුතු කිරීමේ මං මින් අවහිර කෙරිණි. රට තුළ අධිකරණ හා නීති ක්ෂේත්‍රයේ විශ්වාසය බිඳවැටිණි. ජාත්‍යන්තර වටපිටාවෙන් මේ සම්බන්ධව එල්ල වුයේ ද දැඩි විරෝධයකි. නීතියේ ආධිපත්‍ය තහවුරු කර රට තුළ නීතිගරුක සමාජයක් නිර්මාණය කිරීම වෙනුවට කරන ලද්දේ 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා කොමිෂන් සභා අක්‍රීය කොට නීතිය වල් වැදීමට ඉඩ හැරීමය. නීති හා අධිකරණයේ අපක්ෂපාතිත්වය හා ස්වාධීනත්වය මින් තවදුරටත් බිඳ දැමුණි.

නීතිය මෙසේ බිඳ දැමුණු රාමුවක් තුළ ජනයා තුළ නීතිය හා අධිකරණය ගැන විශ්වාසය බිඳ වැටිණි. සාමාන්‍යකාරණාවලට පවා ජනයා නීතිය තම අතට ගෙන විසඳුම් සෙවීමට උත්සුක වූහ. මින් තවදුරටත් සමාජයේ යහපැවැත්ම අභියෝගයන්ට ලක්විණ. අධිකරණයේ හා නීති අංශයන්හි ස්වාධීනත්වය තහවුරු කිරීම ජාතික න්‍යාය පත්‍රයේ අංක එක බවට පත්විණ. 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් කොමිෂන් සභා බලාත්මක කරන ලදී. එහිදී අධිකරණයේ ස්වාධීනත්වය ඉහළින්ම සහතික කරන ලදී.

අධිකරණ ක්ෂේත්‍රයට අදාළ ගැටලු විසඳීමට ප්‍රමුඛත්වය සපයා ඇත. අවශ්‍ය මානව හා භෞතික සම්පත් සපයා ඇත. අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රවීනතම අයට ඉහළ තනතුරු පිරිනමා ආදර්ශය දී ඇත. නව අග විනිසුරුවරයා පත් කිරීමේ නිර්ණායකය ජාතිය, ආගම, කුලය වැනි ගෝත්‍රික සාධක නොව දැනුම, කුසලතාවය හා ප්‍රවීනත්වය පාදක කර ගන්නා ලදී. පක්ෂ විපක්ෂ සැම නීතිය ඉදිරියේ සමානයන්ය යන්න ගැඹුරට

තහවුරු කරමින් ඇත. අධිකරණයේ හා නීති ක්ෂේත්‍රයට කිසිදු අයුරක බලපෑමක් කර නීතිය වත් ගත වීමට ඉඩ නොහැබූ අතර රට අභ්‍යන්තරයේත් ජාත්‍යන්තරය තුළත් මේ සඳහා විශ්වාසය හා කීර්තිය අත්පත් කර ගනිමින් සිටී.







2 5 AUG 2023

# කාම සුඛල්ලියට එරෙහිව

1978 දී දෙවන ජන රජ ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කළ විධායක ජනාධිපති ක්‍රමය ඒකාධිපති ස්වරූපයක් ගත් රාජාණ්ඩු ක්‍රමයකි. එකී තනතුර සඳහා පත්වන්නාට හැසිරීමට බල කරන්නේ ද රජෙකු ලෙසිනි. ජනාධිපති තනතුර උසුලන තැනැත්තාගේ ගති පැවතුම් දැන උගත්කම් වැනි පෞරුෂ ලක්ෂණ මීට ඉවහල් වේ. 1978 සිට 2005 දක්වා එකී තනතුර උසුලන ලද අය කිසියම් විනයගත බවකින් තම චරියාවන් කළමනා කර ගනු ලැබුව ද 2005 සිට ජනාධිපතිවරයාගේ හැසිරීම නග්න ස්වරූපයක් ගත්තේය. බලකාමයෙන් වූ උමතුව මීට පාදක වූ බව නිසැකය.

විධායක ජනාධිපති ධූරය නඩත්තුව උදෙසා වසරකට රුපියල් කෝටි 900ක ජාතික ධනය වනසන ලදී. සතර දිසාවේ මහා මාලිගා ඉදි වුණි. දස දහස් ගණනින් දැසි දසුන් වහලුන් ලෙස සේවයෙහි යෙදවිණ. දහස් ගණන් සුඛෝපභෝගී යාන වාහන පරිහරණය කෙරිණි. ආහාර පාන, පළතුරු, නැව් හා ගුවන් යානා මගින් ගෙන එන ලද්දේ විධායකය හා ඒ වටා භ්‍රමණය වූ සහචර අනුචර කවයේ කාම භෝගී පැවැත්ම වෙනුවෙනි.

ජල බිල්, විදුලිබිල් දිනකට ලක්ෂ ගණනින් විය. බිම්ගත මාලිගා සුරලොව විමන් සදිසි විය. ඉතා මිල අධික උපකරණ පරිහරණය රට දරා ගත නොහැකි තරම් විය. විනෝදය උදෙසා වන උයන් ද සුරතලයට වන සතුන් ද මත්ස්‍යයන් ද නඩත්තුවට වැය කළ වියදම මවිත කරවන සුළුය. විදේශ සංචාර සම්මන්ත්‍රණ හා සමුළු සඳහා විධායකය සහභාගි වූ විට ඊට එක් වූ පරිවාර ජනයා සිය ගණනකි. මොවුන් සඳහා ජාතික ගුවන් යානා වෙන් වූ අතර දින සති ගණන් එවා තබාගෙන ජාතික ධනය විනාශයට මග විවර කරනු ලැබීය. සුපිරි හෝටල් වලට මොවුන් සඳහා වැය කළ ජාතික ධනය ප්‍රකෝටි ගණනකි. ලෝක ප්‍රජාව මේවා දෙස බැලුවේ විශ්මයෙනි.

මෙලෙස විධායක ජනාධිපති ධූරය නඩත්තු කිරීම උදෙසා වැය කළ ජාතික ධනය රුපියල් කෝටි 275ක් දක්වා අඩුකර එය රටේ උන්නතිය සඳහා යොදවනු ලැබීය. යානවාහන, දැසි දසුන්, මාලිගා, ගුවන් යානා ආදී නෙක සම්පත් බැහැර කරන ලදී. සරළ ජීවන විලාසිතාවකට හුරුව ජාතියට ආදර්ශය සපයා ඇත. කාම භෝගී මහේශාක්‍ය කුමාර ජීවන විලාසිතාව නඩත්තු කිරීමට දැය ගෙවන ලද වන්දිය සුවිශාලය. මේ සම්බන්ධව පළ වූ ජනයාගේ කෝපය හා වෛරය ගැඹුරට අවබෝධ කර ගත යුතුය. ශ්‍රී ලංකාවේ සාතිශය බහුතරය තාමත් ඉතා දිළින්දන්ය. දෛනික මූලික අවශ්‍යතා සපුරා ගෙන ඇත්තේ ජනයාගෙන් අඩකටත් අඩුවෙනි. රටේ ගැමි කාන්තාවන් තම පවුල් ජීවිත ද වනසා ගනිමින් අපා දුක්පිරිපත විඳිමින් අරාබි කලාපයේ වහල් සේවයේ යෙදී ජාතික ධනය සපුරාලයි. ඒවා හුදු ආත්මාර්ථකාමී තනි පුද්ගල සුඛ විහරණය සඳහා භාවිතයට ගැනීම පාපයෙකි. සතර මහා නරකාදියෙහි කල්ප කාලාන්තරයක් විසීමට එය හේතු වන්නකි. එබැවින් විධායක ජනාධිපතිවරයා සතු අත්තනෝමතික බලය ප්‍රජාතාන්ත්‍රිකරණය කළා සේම එකී තනතුර සරළව ක්‍රියාත්මක කළ හැකි බවට ආදර්ශය රටට තහවුරු කර ඇත. මේ බලගතු ආදර්ශය ජාතියේ හිත සුව පිණිසම හේතු වනු ඇත්තේය.



"රටේ ජනාධිපතිවරයා ලෙස මට කිසිඳු බෙදීමක් නැහැ,
රජෙක් ලෙස නොව මහජන සේවකයෙක් ලෙස ජනතාව වෙනුවෙන් උපරිම සේවාවක් ඉටු කරනවා!"

(2015-05-24 [illegible])